*සැ. යු.-* 2023.11.10 වැනි දින පළ කරන ලද අංක 2358 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2023 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,359 - 2023 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2023.11.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2850 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2856 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2847 - B 82515 — 5,403 (2023/11)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විතවන අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස 20 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | ගෝමරන්කඩවල | කට්ටුකුලම් දකුණ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කට්ටුකුලම් බටහිර කොට්ඨාසයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

11-291

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**ගම්පහ දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාග යකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස 18** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 21 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | මීගමුව | උතුරු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ මීගමුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |
| ගම්පහ | බියගම | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ මල්වාන ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |
| ගම්පහ | කැළණිය | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ කැළණිය හුණුපිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

11-436

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාග යකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස 18** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | රිදීගම | වැඋඩවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ පනාගමුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

11-437

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

### පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාග යකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස** 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | කල්පිටිය | කල්පිටිය කොට්ඨාසයේ මුඩලෙයිපාලි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

11-438

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**මාතලේ දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාග යකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස** 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | යටවත්ත | මාතලේ දකුණ කොට්ඨාසයේ නිකගොල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ |
| මාතලේ | උකුවෙල | මාතලේ දකුණ කොට්ඨාසයේ උකුවෙල ප්‍රදේශයේ මුස්ලිම් අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ |

11-440

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මාතලේ දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විතවන අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස 18 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | උකුවෙල | මැදසිය පත්තුව බටහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ දකුණ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

11-439

---

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විතවන අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස 20 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මුතූර් | කොඩ්ඩියාර් උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මුතූර් කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

11-441

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**මඩකලපුව දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විතවන අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2023 දෙසැම්බර් මස 28 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2023 නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මඩකලපුව | මන්මුනේ උතුර | මන්මුනේ උතුර (පුලියන්තීවු) කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව. |

11-442

## අධ්‍යාපන අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### බාහිර දේශක / උපදේශක සඳහා බාහිර සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම - 2024 අධ්‍යයන වර්ෂය

මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාලවල බාහිර දේශන / උපදේශක තනතුරු සඳහා බාහිර සම්පත්දායකයින් ලියාපදිංචි කිරීමට මෙම නිවේදනය අවසානයේ දක්වා තිබෙන තාක්ෂණ විද්‍යාලවල /කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂ-වරුන් / විදුහල්පතිවරුන් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාලවල බාහිර පදනම මත දේශන පැවැත්වීමට නියමිතව තිබෙන විෂයයන් පිළිබඳ විස්තර සහ ආදර්ශ අයදුම්පත්‍රය තමා සේවය කිරීමට අදහස් කරන තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත (9" X 4"ප්‍රමාණයේ) තම ලිපිනය සහ මුද්දර ඇලවූ ලියුම් කවරයක් යැවීමෙන් ලබාගත හැකි වේ. ඔබ එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බාහිර සම්පත් දායකයින්" යනුවෙන් සඳහන් කරන්න. නොඑසේ නම් තාක්ෂණ / කාර්මික විද්‍යාලවලට පැමිණ මෙම විස්තර පත්‍රිකා ලබාගත හැකි ය.

03. මෙම විස්තර පත්‍රිකා ලබාගත හැකි අවසාන දිනය **2023.12.01** වැනි දින වේ. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2023.12.15** වේ.

04. බාහිර උපදේශකයින් ලෙස බඳවා ගැනීමට තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-

I. බාහිර දේශකයින් / උපදේශකයින් ලෙස බඳවා ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත චක්‍රලේඛනයේ සඳහන් සුදුසුකම්වලට අනුව සිදු කරනු ලැබේ. ඒ අනුව සියලුම අපේක්ෂකයින් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ඒ ඒ පාඨමාලාවලට අදාළ ක්ෂේත්‍රයේ තම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව, සපුරා ගත් වෘත්තීය සුදුසුකම් / කාර්මික අංශයේ ලබා ඇති සුදුසුකම් / අදාළ විෂයයන් ඉගැන්වීමේ හෝ අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු කිරීමෙන් ලබා ගත් පළපුරුද්ද අවම වශයෙන් වසර 05ක් සපුරාගෙන තිබිය යුතු වේ.

II. NVQ 3/4 මට්ටමේ පාඨමාලාවල ඉගැන්වීම් හෝ පුහුණු කිරීම් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලෙස ඃ

(*a*) විෂය ක්ෂේත්‍රයට අදාළව NCT හෝ NVQ - 5 මට්ටමට සමාන සුදුසුකම් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව රජය පිළිගත් වෙනත් සහතිකයක් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද;

(*b*) විෂය ක්ෂේත්‍රයට අදාළව NVQ - 6 මට්ටමට සමාන සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද (උදාඃ- HNDE /NDT/NDES වැනි අදාළ ක්ෂේත්‍රයේ රජය පිළිගත් වෙනත් සුදුසුකම්);

(*c*) අදාළ ක්ෂේත්‍රයේ උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ සම මට්ටමේ වෘත්තීමය සුදුසුකම සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද.

III. NVQ 5 මට්ටමේ පාඨමාලාවල ඉගැන්වීම් හෝ පුහුණු කිරීම් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලෙස ඃ

(*a*) විෂය ක්ෂේත්‍රයට අදාළව NVQ - 5 මට්ටමේ සුදුසුකම් සහ අදාල විෂය ඉගැන්වීමේ හෝ අදාල කර්මාන්තයේ අවම වසර 5ක පලපුරුද්ද හෝ NCT සමග වසර 10 ක ඉගැන්වීමේ හෝ අදාළ කර්මාන්තයේ පළපුරුද්ද (පළමු සමාසිකයේ (ප්‍රථම වසර) හා දෙවන වසර සමාසිකයේ (දෙවන වසර) ඉගැන්වීම් කටයුතු සඳහා පමණි.);

(*b*) විෂය ක්ෂේත්‍රයට අදාළව NVQ - 6 මට්ටමට සමාන සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද ( උදාඃ- HNDE /NDT /NDES වැනි අදාළ ක්ෂේත්‍රයේ රජය පිළිගත් වෙනත් සුදුසුකම්);

(*c*) අදාල ක්ෂේත්‍රයේ උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ සමාන මට්ටමේ වෘත්තීමය සුදුසුකම සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද;

(d) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි/ ආචාර්ය උපාධි සුදුසුකම් හෝ සමාන වෘත්තීමය සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද.

IV. NVQ 6 මට්ටමේ පාඨමාලාවල ඉගැන්වීම් හෝ පුහුණු කිරීම් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලෙස ඃ

(a) අදාළ ක්ෂේත්‍රයේ උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන වෘත්තීමය සුදුසුකම සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද;

(b) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි/ ආචාර්ය උපාධි සුදුසුකම් හෝ සමාන වෘත්තීමය සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 5ක පළපුරුද්ද.

V. ගාස්තු ගෙවීමඃ-
බාහිර සම්පත් දායකයින්හට ගෙවන ගාස්තුව ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීමය පළපුරුද්ද, පාඨමාලාවේ NVQ මට්ටම් අනුව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ බාහිර උපදේශක ගෙවීම් චක්‍රලේඛනය මත පදනම් ව පැයකට ගෙවන රේටය රු. 400 සිට රු. 1,000 දක්වා වෙනස් වනු ඇත.

VI. අයදුම්පත් ඉදිරිපත් කිරීම ඃ-
රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ තම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා මගිනි. මෙවැනි අපේක්ෂකයෙක් මෙම කාර්යය සඳහා තෝරාගතහොත් එලෙස සේවයේ යෙදීම නිසා සිය රාජකාරී කටයුතුවලට බාධා නොවන බවට තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ස්වකීය ඉල්ලුම්පත්‍රයෙ හි සඳහන් කරවා ගැනීමට අපේක්ෂකයා විසින් වගබලා ගත යුතු වේ.

VII. තෝරා ගැනීම ඃ-
බාහිර සම්පත් දායකයින් ලෙස ලියාපදිංචිය සඳහා තෝරා ගනු ලබන්නේ අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමෙන් පසුවය. අදාළ විෂයයන් ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ට තෝරා ගැනීමේ දී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයෙකුගේ බාහිර උපදේශක පත්වීම විද්‍යාලයේ අවශ්‍යතාව අනුව ලිඛිතව නිසි හේතු දැක්වීමකින් පසුව ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට අධ්‍යක්ෂ / විදුහල්පතිට හැකි බව ද සැලකිය යුතු වේ.

VIII. බාහිර සම්පත් දායකයින් ලෙස ලියාපදිංචි වන උපදේශකයින් තමන් ඉගැන්වීම් සිදු කරන තාක්ෂණ/කාර්මික විද්‍යාලවල අභ්‍යන්තර විභාග කටයුතු සඳහා විශේෂ ගෙවීමකින් තොරව සහභාගී විය යුතු අතර වර්ෂ අවසාන/සමාසික විභාග සඳහා අවශ්‍ය අවස්ථාවල දී විභාග ප්‍රශ්නපත්‍ර ඇගයීම් කටයුතු සඳහා ද සහයෝගය ලබා දිය යුතුය.

05. මෙම බාහිර උපදේශක ලියාපදිංචිය 2024 අධ්‍යයන වර්ෂය සඳහා පමණක් වන අතර, කිසිදු ස්ථිර තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නැත.

06. ඉල්ලුම්පත්‍ර එවීමේ දී විෂයයන් එකකට වැඩි ප්‍රමාණයකට ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් විෂයය සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර යොමු කළ යුතු වේ. මෙම සෑම අයදුම්පතක්ම අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

07. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා මාධ්‍ය අතර වෙනසක් ඇතොත් සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10.
www.dtet.gov.lk

### තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල ලැයිස්තුව

| අනු. අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ |
| 02 | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල | ගාල්ල |
| 03 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල, මහනුවර | මහනුවර |
| 04 | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය |
| 05 | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල |
| 06 | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය |
| 07 | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම පාර, කුරුණෑගල | කුරුණෑගල |
| 08 | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉඟිනියාගල පාර, අම්පාර | අම්පාර |
| 09 | රත්නපුරය තාක්ෂණ විද්‍යාලය | ෆාම් ගාර්ඩ්න්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය |
| 10 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල |
| 11 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලු පාර, රත්මලාන | කොළඹ |
| 12 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර | මාතර |
| 13 | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ | අම්පාර |
| 14 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර |
| 15 | වරකාපොල කාර්මික විද්‍යාලය | අඟුරුවැල්ල පාර, වරකාපොල | කෑගල්ල |
| 16 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල |
| 17 | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට | මහනුවර |
| 18 | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය | නුවරඑළිය |
| 19 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම | කොළඹ |
| 20 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට |
| 21 | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක | මහනුවර |
| 22 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ |
| 23 | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රිය පොළ පාර, වඳුරුව, බලපිටිය | ගාල්ල |
| 24 | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | කුරුණෑගල |
| 25 | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්චන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව |
| 26 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල | බදුල්ල |
| 27 | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල | මොණරාගල |
| 28 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල | ගම්පහ |
| 29 | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| 30 | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය | අම්පාර |
| 31 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී. පාර, මාතලේ | මාතලේ |
| 32 | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | හම්බන්තොට |
| 33 | මැදගම කාර්මික විද්‍යාලය | මැදගම, බිබිලේ හරහා | මොණරාගල |
| 34 | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව | පොළොන්නරුව |
| 35 | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නව නගරය, ඇඹිලිපිටිය | රත්නපුර |
| 36 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | වවුනියාව |
| 37 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව | අම්පාර |
| 38 | ආණමඩුව කාර්මික විද්‍යාලය | ගම්උදා භූමිය, තම්මැන්නාගම, ආණමඩුව | පුත්තලම |
| 39 | මන්නාරම කාර්මික විද්‍යාලය | පන්නායි, වෙඩ්ඩුවන් හන්දිය, මඩුපාර | මන්නාරම |

11-504/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (II) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (I)

අංක 2,357 හා 2023.11.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත විභාග නිවේදනයේ සඳහන් විභාගවලට අයදුම්පත යොමු කිරීම සඳහා ලබා දී ඇති කාලය **2023.11.22 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා** දීර්ඝ කරනු ලැබේ.

02. එම විභාග පවත්වනු ලබන දින ඇතුළුව නිවේදනයේ අනෙකුත් විධිවිධාන නොවෙනස්ව බලපැවැත්වේ.

කේ. ඩී. එන්. රංජිත් අසෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2023 නොවැම්බර් මස 10 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

11-423

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023

දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම්ලත් ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications -Recruitment Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2023.12.01 දින වේ.** මෙම විභාගය **2024 ජනවාරි මස** පවත්වනු ලැබේ.

02. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 මේ සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් මෙම *ගැසට්* නිවේදනයේ 10.1 වගන්තිය පරිදි ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ.

2.2 ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතා අනුපිළිවෙළට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට(03) සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම *ගැසට්* නිවේදනයේ 10.2 වගන්තිය පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ නාමලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.(සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් සපුරනු ලැබූ අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ 10.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත සෘජුව යොමු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලබන අතර අයදුම්කරුවන් විසින් පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය මනාපය ප්‍රමුඛතා අනුපිළිවෙළින් දැක්විය යුතුය.

2.4 ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ, **ඉල්ලුම් කර ඇති භාෂා මාධ්‍යය හා විෂය අනුව පාසල් පාදක ව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.**

2.5 මෙම *ගැසට්* නිවේදනයට අදාළ පත්වීම් විෂයන් හි පුරප්පාඩු උපලේඛනය 04හි සඳහන් වේ. උපලේඛනයේ සඳහන් ගුරු පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**සටහන 1**

එකම පාසලට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් කිහිපදෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක දී පාසල් සඳහා ස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

2.6 මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ පාසල් පාදක පුරප්පාඩු පදනම් කරගනිමින් වන බැවින් වසර පහ (05) ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

3.2 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

3.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ඔබ ලබා ගත යුතුය.

3.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3.5 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට ද අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 03/2016 (iv) දරන වැටුප් චක්‍රලේඛයට අනුව

GE 01-2016 හි රු. 31,490 -445x6 -525x7 -600x2- රු. 39,035/-(මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණිය සඳහා මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු. 37,835 වැටුපෙ හි පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් :

5.1 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2023.12.01 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක් සමඟ සටහන 3 හි සඳහන් කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

5.1.2 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය. ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළව ස්වකීය උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් (Credit සංඛ්‍යාවෙන්) 1/3 ක් සම්පූර්ණ කළ අයවලුන් විය යුතුය.

**ඉතා වැදගත්.-** ඉහත 5.1.1 හා 5.1.2 කොන්දේසිවලට අමතර වශයෙන් ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

- ස්වකීය උපාධියට අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය.
- උසස් පෙළ විෂය නිර්දේශයන්ට අදාළ ව උපාධියෙ හි පවතින විෂය සන්ධාරයන් සුදුසුකම් පරික්ෂා කිරීමේ දී සලකා බලනු ලැබේ.
- ඉල්ලුම් කරනු ලබන විෂයට අදාළව ප්‍රධාන විෂයයක් සහිත උපාධි නොමැති අවස්ථාවන්හි දී ලබා ඇති උපාධිය සමඟ සටහන 3හි දක්වා ඇති අමතර සුදුසුකම් ද සලකා බලනු ලැබේ.
- උපාධියෙ හි විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙ හි (Transcript) විෂය සන්ධාරය (credit සංඛ්‍යාව) සඳහන් නොවේ නම් එය අදාළ විශ්වවිද්‍යාලය මඟින් තහවුරු කර අදාළ ලේඛන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

- උපාධියෙ හි විෂය සන්ධාරය පිළිබඳව ඇතිවන ගැටලු සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතු වේ.

5.1.3 ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සෑම අයදුම්කරුවකු ම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) විභාගය හා සමානව පිළිගනු ලබන වෙනත් විභාග සමතුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

**සටහන 2**

පහත සඳහන් පරිදි එක් එක් විෂයය සම්බන්ධයෙන් එහි දක්වා ඇති සුදුසුකම් අවම සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

අ. පො. ස (උසස් පෙළ) හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ විෂයයන්

| *විෂය කේත අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 101 | රසායන විද්‍යාව Chemistry | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස; *හෝ* අනෙක් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා තිබීම; *හෝ* තුන් අවුරුදු උපාධියක දී මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයෙන් සම්පූර්ණ කර තිබීම. |
| 102 | භෞතික විද්‍යාව Physics | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස *හෝ* අනෙක් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අ. පො. ස. (උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා තිබීම; *හෝ* තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයයෙන් සම්පූර්ණ කර තිබීම. |
| 103 | ජීව විද්‍යාව Biology | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව හදාරා තිබීම හා ප්‍රධාන විෂය උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව වනවිට අනෙක් විෂයයක් ලෙස සත්ත්ව විද්‍යාව ද ප්‍රධාන විෂය සත්ත්ව විද්‍යාව වන විට අනෙක් විෂයයක් ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව ද අවම වශයෙන් වසර දෙකක දී වත් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම; *හෝ* තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන් දෙකෙහි ම එකතුව,මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක බැගින් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම. |
| 104 | කෘෂි විද්‍යාව Agricultural Science | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management)<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture)<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය (B.Sc. Agricultural Resources Management and Technology)<br>විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිය (B.Sc. Agri Business Management)<br>විද්‍යාවේදී අපනයන කෘෂිකර්ම උපාධිය<br>(B.Sc. Export Agriculture)<br>ඉහත නම් සඳහන් උපාධි; *හෝ*<br>උසස් පෙළ කෘෂි විද්‍යාව විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණයවන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. |
| 105 | සංයුක්ත ගණිතය Combined Mathematics | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හදාරා තිබීම හා ප්‍රධාන විෂය ව්‍යවහාරික ගණිතය වනවිට අනෙක් විෂය ලෙස ශුද්ධ ගණිතය ද ප්‍රධාන විෂය ශුද්ධ ගණිතය වන විට අනෙක් විෂය ලෙස ව්‍යවහාරික ගණිතය ද අවම වශයෙන් වසර දෙකක දී වත් හදාරා තිබීම; *හෝ* තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙහි ම එකතුව, මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් බැගින් හදාරා තිබීම. |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය Engineering Technology | උපාධියෙ හි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් සහිත ව ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් යන විෂයය ක්ෂේත්‍ර ආවරණයවන පරිදි උපාධිය සම්පූර්ණ කර තිබීම; *හෝ* ඉංජිනේරු උපාධිය (ඉදිකිරීම්, යාන්ත්‍රික,විදුලි හා/හෝ ඉලෙක්ට්‍රොනික්) ලබා තිබීම. |

| *විෂය ක්ෂේත්‍ර අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය<br>Bio Systems Technology | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management)<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture)<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය (B.Sc. Agricultural Resources Management and Technology) ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය (BBST)<br>ඉහත නම් සඳහන් උපාධි; *හෝ*<br>උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. |
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාවScience for Technology | විද්‍යාවේදී උපාධියෙ හි පවතින මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් භෞතික විද්‍යාව අන්තර්ගත වන උපාධියක් හදාරා තිබීම. |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information & Communication Technology | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක්; *හෝ*<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස ඇති උපාධියක්.<br>උපාධි පාඨමාලාවට අයත් මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අයත් විය යුතුය. |
| 110 | ඉංග්‍රීසි<br>English | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්; *හෝ*<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 111 | අරාබි<br>Arabic | අදාළ විෂයට විශේෂ උපාධියක් ලබා තිබීම; *හෝ*<br>අදාළ විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරණු ලැබූ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| 112 | රුසියන්<br>Russian | |
| 113 | ප්‍රංශ<br>French | |
| 114 | ජපන්<br>Japanese | |
| 115 | චීන<br>Chinese | |
| 116 | කොරියන්<br>Korean | |
| 117 | හින්දි<br>Hindi | |
| 118 | ජර්මන්<br>German | |
| 119 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය Child Psychology and Care | ළමා මනෝ විද්‍යාව විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක්; *හෝ*<br>ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 120 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය Health and Social Care | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය; *හෝ*<br>සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 121 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා Physical Education and Sport | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය; *හෝ*<br>ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |

| *විෂය ක්ෂේත්‍ර අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 122 | ප්‍රාසාංගික කලාව<br>Performing Arts | ප්‍රාසාංගික කලා පිළිබඳ විශේෂ උපාධිය *හෝ*<br>ශාස්ත්‍රවේදී-විශේෂ (ප්‍රාසංගික කලා/ලලිත කලා/නර්තනය/සංගීතය) උපාධිය *හෝ*<br>නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය; *හෝ*<br>ප්‍රාසාංගික කලාව *හෝ* ලලිත කලාව ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 123 | කාර්ය සිද්ධි කළමනාකරණය Event Management | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ කාර්ය සිද්ධි කළමනාකරණය පිළිබඳ කළමනාකරණය උපාධිය; *හෝ*<br>කාර්ය සිද්ධි කළමනාකරණය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධියක් ලබා තිබීම. |
| 124 | ශිල්ප කලා<br>Arts and Crafts | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී); *හෝ*<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය; (චිත්‍ර කලා සහ ග්‍රැෆික්); *හෝ*<br>දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය; හෝ<br>ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (චිත්‍ර කලා/ග්‍රැෆික්/මූර්ති/දෘශ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයක් *හෝ* ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය). |
| 125 | අභ්‍යන්තර නිර්මාණකරණය<br>Interior Designing | ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වූ විද්‍යාවේදී උපාධිය *හෝ* නිර්මාණවේදී උපාධිය; *හෝ*<br>ගෘහ නිර්මාණ ශිල්පය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය; *හෝ*<br>අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 126 | විලාසිතා නිර්මාණකරණය<br>Fashion Designing | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා); *හෝ*<br>නිර්මාණවේදී උපාධිය; *හෝ*<br>විලාසිතා නිර්මාණකරණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය; *හෝ*<br>විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 127 | ග්‍රැෆික් නිර්මාණකරණය<br>Graphic Designing | නිර්මාණවේදී උපාධිය; *හෝ*<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර සහ ග්‍රැෆික්); *හෝ*<br>පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය; *හෝ*<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය; *හෝ*<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය; *හෝ*<br>උපාධියට ප්‍රධාන විෂයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ඇතුළත් උපාධියක්; *හෝ*<br>පරිගණක විද්‍යාව විෂය ඇතුළත් විද්‍යාවේදී උපාධිය *හෝ* (ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමකින් යුතු ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂය කොටස් හදාරා සමත් වී තිබිය යුතුය.)<br>ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 128 | භූ දර්ශන නිර්මාණකරණය<br>Landscaping | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී උද්‍යාන විද්‍යාව/භූ දර්ශන නිර්මාණකරණය විෂයක් වශයෙන් හදාරා තිබීම; *හෝ*<br>භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 129 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය<br>Applied Horticultural Studies | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී උද්‍යාන විද්‍යාව/ භූ දර්ශන නිර්මාණකරණය විෂයයක් වශයෙන් හදාරා තිබීම; *හෝ*<br>ව්‍යවහාරික උද්‍යාන විද්‍යාව ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 130 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය<br>Livestock Product Studies | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය; *හෝ*<br>සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |

| *විෂය ක්ෂේත්‍ර අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 131 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය<br>Food Processing Studies | ආහාර විද්‍යාව හා තාක්ෂණය උපාධිය; *හෝ*<br>ආහාර විද්‍යා හා පෝෂණය පිළිබඳ උපාධිය; *හෝ*<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී ආහාර විද්‍යාව/ආහාර නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම; *හෝ*<br>ආහාර නිෂ්පාදන තාක්ෂණය *හෝ* ආහාර සැකසුම් තාක්ෂණවේදය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 132 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය<br>Aquatic Resource Studies | ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය/ජලජ සම්පත් තාක්ෂණය විෂයක් වශයෙන් හදාරා තිබීම; *හෝ*<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>ධීවර හා සාගර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 133 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය<br>Plantation Product Studies | අපනයන කෘෂිකර්මය පිළිබඳ උපාධිය; *හෝ*<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී වැවිලි භෝග/වැවිලි බෝග නිෂ්පාදනය තාක්ෂණය විෂයක් වශයෙන් හදාරා තිබීම; *හෝ*<br>වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණය විෂයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 134 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය Construction Studies | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය; *හෝ*<br>තාක්ෂණවේදී උපාධිය; *හෝ*<br>ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ වෙනත් ඕනෑම උපාධියක්; *හෝ*<br>ඕනෑම උපාධියක් සමඟ අවු. 2ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව හෝ අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 135 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය Automobile Studies | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික); *හෝ*<br>විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය; *හෝ*<br>මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 136 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය<br>Electrical and Electronic Studies | විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය; *හෝ*<br>ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය; *හෝ*<br>ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය; *හෝ*<br>විදුලි හෝ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 137 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය<br>Textile and Apparel Studies | නිර්මාණවේදී උපාධිය; *හෝ*<br>පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු විද්‍යා ප්‍රථම උපාධිය; *හෝ*<br>තාක්ෂණවේදී උපාධිය; *හෝ*<br>පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 138 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය<br>Metal Fabrication Studies | තාක්ෂණවේදී උපාධිය (යාන්ත්‍රික); *හෝ*<br>යාන්ත්‍රික තාක්ෂණවේදය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ සාමාන්‍ය උපාධිය; *හෝ*<br>ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක්; *හෝ*<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ලෝහ සැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. |

| *විෂය ක්ෂේත්‍ර අංකය* | *විෂයය* | *සුදුසුකම්* |
|---|---|---|
| 139 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය Aluminium Fabrication Studies | තාක්ෂණවේදී උපාධිය (සිවිල් / ඉදිකිරීම්/ යාන්ත්‍රික); *හෝ*<br>ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක්; *හෝ*<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 140 | පරිගණක දෘඪාංග සහ ජාලකරණය Computer Hardware and Networking | වසර තුනක පාඨමාලා කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ව විෂය කොටස් හදාරා තිබීම); *හෝ*<br><br>වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විෂය කොටස් හදාරා තිබීම); *හෝ*<br><br>පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/ තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම හා එහි මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හදාරා සමත් වී තිබීම.<br><br>විෂය ක්ෂේත්‍ර<br>(i) Computer Hardware<br>(ii) Computer system Engineering<br>(iii) Computer Networks<br>(iv) Computer Architecture<br>(v) Operating System<br>(vi) Electronics<br>(vii) Arduino Technology<br>(viii) IT Security<br>(ix) Network Security<br>(x) Information Security<br>(xi) Cyber Security<br>(xii) Computer Hardware and Network related projects |
| 141 | නිෂ්පාදනය Manufacturing | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම. |
| 142 | සංචරණය හා ආගන්තුක සත්කාර Tourism & Hospitality | විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය; *හෝ* විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය; *හෝ*<br>ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය; *හෝ*<br>ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය *හෝ* සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය; *හෝ*<br>සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය; *හෝ*<br>සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. |
| 143 | සැපයුම් කළමනාකරණය Logistic Management | උපාධියට ප්‍රධාන විෂයක් ලෙස සැපයුම් කළමනාකරණය විෂය හදාරා තිබීම. |
| 144 | අලෙවිකරණය Marketing | අලෙවි කළමනාකරණය පිළිබඳව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව හෝ කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ වාණිජවේදී උපාධිය හෝ ප්‍රධාන විෂයයක් ලෙස අලෙවි කළමනාකරණය ඇතුළත් උපාධියක් ලබා තිබීම. |

5.1.4. වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව 2005.12.01 දිනට හෝ ඊට පෙර හා 1988.12.01 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

5.1.5. අනෙකුත් අවශ්‍යතා :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

v. මෙම විභාගය සඳහා **විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්** ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම් කිරීමේ ක්‍රමය :

6.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. මාර්ගගතව ඉදිරිපත් කළ අයදුම්පත් සංශෝධනය කිරීමට අවශ්‍ය වන්නේ නම් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඒ සඳහා අවස්ථාව සලසා ඇත. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 විභාග පරිපාටිය :

6.2.1 මෙම විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

6.2.2 මෙම බඳවා ගැනීම් නිවේදනයේ අවසානයේ වන උපලේඛන 03 හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් විභාගය පැවැත්වේ. අයදුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන නගර උපලේඛන 03 අනුව ම විය යුතු අතර ඉල්ලුම් කරන ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

6.2.3 සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. විභාගය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍ය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) පත්වීම් විෂයෙහි මාධ්‍ය ලෙස සැලකේ.

6.2.4 අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විෂය, විෂය සඳහා මනාප අනුපිළිවෙළ, ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය, විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

6.2.5 විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ. සෑම අයදුම්කරුවකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02)පෙනී සිටිය යුතුය. සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

6.2.6 එක් වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

6.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

6.4 දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

6.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම

ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. ප්‍රවේශපත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත හා එය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

07. විභාගයට පෙනී සිටීම :

7.1 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**සටහන 3**

අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත්වීමම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :

8.1 විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

8.2 එමෙන් ම විභාග අපේක්ෂකයින් තම අනන්‍යතාව තහවුරු කර ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10. විෂය නිර්දේශය :

10.1 ලිඛිත විභාගය :

මෙම විභාගයට නියමිත ප්‍රශ්නපත්‍ර සංඛ්‍යාව දෙකකි. සුදුසුකම් ලැබීම සඳහා ප්‍රශ්නපත්‍ර දෙක සඳහා ම පෙනී සිටීම අනිවාර්යය වේ.

(i). අභියෝග්‍යතාව - කාලය පැය එක (01) යි. (ලකුණු 100යි)
සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යූහ සහ අන්තර් සම්බන්ධතාවලට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව, ප්‍රමාණකරණය, කාලය හා අවකාශ අතර සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයා සතු කුසලතාව මිනුම් කිරීම අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න පනහ (50) කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

(ii). සාමාන්‍ය දැනීම - කාලය පැය එක (01) යි. (ලකුණු 100 යි)
ගුරු ක්ෂේත්‍රයට අදාළ ව එම ක්ෂේත්‍රය පිළිබඳ ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන, තාක්ෂණික, ගුරු අධ්‍යාපනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 2010 වර්ෂයෙන් පසුව සිදු කරන ලද දේශීය අධ්‍යාපන නවීකරණ පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

10.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

**සටහන 4**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූල ව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

10.3 ප්‍රායෝගික පරීක්ෂණය :
ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා මිනිත්තු පහකට (05) නො අඩු කාලයක් ලබාදෙනු ලැබේ. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ. :

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

**සටහන 5**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

10.3.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මිනිත්තු පහකට (05) නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායකය සඳහා අවම වශයෙන් ලකුණු දෙක(02) බැගින් ලබා ගත යුතුය.

(iv) ප්‍රායෝගික පරීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

10.3.2 නිර්ණායකයන් හි අරමුණු :

(i) *අරමුණ හා ප්‍රවිශ්ට වීම;*
සාර්ථක ව පාඩමෙ හි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

(ii) *පෞරුෂය හා හඬ පාලනය;*
ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

(iii) *සන්නිවේදනයේ පැහැදිලි බව;*
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

(iv) *කාලය කළමනාකරණය;*
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම.

(v) *ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය;*
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.

11. විභාග ගාස්තු :

11.1 විභාග ගාස්තුව රු. 1200 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මඟින් (Through any bank debit card with internet transaction facilities)

III. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මඟින් (Bank of Ceylon Online Banking Method)

IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Bank of Ceylon Teller Slip Payments)

**සටහන 6**

ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

11.2 ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

11.3 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ සිදු කරනු නොලැබේ.

12. විභාග ප්‍රතිඵල :

12.1 ලිඛිත විභාගයට පෙනී සිට විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ අවසන් ප්‍රතිඵල ලේඛනය සකස් කරනු ලැබේ. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

13. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :

පහත උපලේඛන (01, 02, 03 හා 04) භාවිතකර මාර්ගගත අයදුම්පත සකසා තිබේ.

**උපලේඛනය 01**

| *භාෂා මාධ්‍යය* | *කේත අංකය* |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 4 |

**උපලේඛනය 02**

| *පළාත* | *කේත අංකය* |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| දකුණු පළාත | 03 |
| උතුරු පළාත | 04 |
| නැගෙනහිර පළාත | 05 |
| වයඹ පළාත | 06 |
| උතුරු මැද පළාත | 07 |
| ඌව පළාත | 08 |
| සබරගමුව පළාත | 09 |

.

**උපලේඛනය 03**

| *දිස්ත්‍රික්කය/නගරය* | *කේත අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුරය | 24 |
| කෑගල්ල | 25 |

**උපලේඛනය 04**

| විෂයය කේත අංකය | විෂයය | ජාතික පාසල් | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍ය |
| 101 | රසායන විද්‍යාව | 130 | 36 | 32 |
| 102 | භෞතික විද්‍යාව | 176 | 55 | 43 |
| 103 | ජීව විද්‍යාව | 106 | 38 | 30 |
| 104 | කෘෂි විද්‍යාව | 84 | 24 | 06 |
| 105 | සංයුක්ත ගණිතය | 83 | 40 | 30 |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය | 79 | 39 | 0 |
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය | 48 | 18 | 0 |
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 86 | 49 | 0 |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 59 | 52 | 33 |
| 110 | ඉංග්‍රීසි | | | 54 |
| 111 | අරාබි | 1 | 9 | |
| 112 | රුසියන් | 3 | 0 | |
| 113 | ප්‍රංශ | 61 | | |
| 114 | ජපන් | 37 | | |
| 115 | චීන | 109 | | |
| 116 | කොරියන් | 135 | | |
| 117 | හින්දි | 12 | | |
| 118 | ජර්මන් | 61 | | |
| 119 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | 5 | 3 | |
| 120 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | 2 | 2 | |
| 121 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | 5 | 2 | |
| 122 | ප්‍රාසාංගික කලාව | 1 | 1 | |
| 123 | කාර්ය සිද්ධි කළමනාකරණය | | 3 | |
| 124 | ශිල්ප කලා | 3 | 4 | |
| 125 | අභ්‍යන්තර නිර්මාණකරණය | 4 | 2 | |
| 126 | විලාසිතා නිර්මාණකරණය | 8 | 6 | |
| 127 | ග්‍රැෆික් නිර්මාණකරණය | 11 | 8 | |
| 128 | භූ දර්ශන නිර්මාණකරණය | 3 | 3 | |
| 129 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | 1 | 6 | |
| 130 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 2 | 3 | |
| 131 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 4 | 7 | |
| 132 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | 3 | 3 | |
| 133 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | 7 | 2 | |
| 134 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | 2 | 5 | |
| 135 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | 1 | 3 | |

| *විෂයය කේත අංකය* | *විෂයය* | *ජාතික පාසල්* | | |
|---|---|---|---|---|
| | | *සිංහල මාධ්‍යය* | *දෙමළ මාධ්‍යය* | *ඉංග්‍රීසි මාධ්‍ය* |
| 136 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | 7 | 6 | |
| 137 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | 6 | 4 | |
| 138 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | 1 | | |
| 139 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | | 1 | |
| 140 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය | 9 | 5 | |
| 141 | නිෂ්පාදනය | | 2 | |
| 142 | සංචරණය හා ආගන්තුක සත්කාර | 7 | 12 | |
| 143 | සැපයුම් කළමනාකරණය | 3 | 1 | |
| 144 | අලෙවිකරණය | 2 | 4 | |

14. අයදුම්පත් මාර්ගතව පමණක් භාර ගනු ලැබේ. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ අංක 15 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කරන ලද මුද්‍රිත පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

15. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බැලීමක් සිදු කරනු නොලැබේ.

16. එමෙන් ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

17. ඔබ අයදුම්පතෙ හි සඳහන් කරනු ලබන කිසිදු කරුණක් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

18. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වන අතර කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවකින් කොටසක් හෝ මුළුමනින් ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ.

19. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.
2023 නොවැම්බර් මස 14 වැනි දින

11-435